5.

දූෂණයෙන් තොර රටක් බිහිකිරීමේ සිහිනය සැබෑ කරගැනීමට සැවොම එක්වෙමු

- වැලිඅමුණ

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ හිතිඥ ජේ.සී වැලිඅමුණ මහතා පසුගිය දෙසැම්බර් 31 වනදා එම ධූරයෙන් සමුගන්නේය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ප්‍රථම විධායක අධ්‍යක්ෂවරයා වූ මුතු මෙරට ඒජිඩ ක්ෂේත්‍රයන්හි දූෂණය අවම කරලීමටත්, විනිවිදභාවය හා වගවීම ඉහළ නංවමින් යහපාලනය ස්ථාපිත කිරීම සඳහා වූත් ආයතනික මෙහෙවරට වසර අටක් තිස්සේ නායකත්වය සපයයි.

රටේ අභිවෘද්ධිය වෙනුවෙන් දූෂණය අවම කරලීමට හා යහපාලනය ශක්තිමත් කිරීමට පසුගිය කාලය පුරා එක්ව ක්‍රියා කළ සියලුදෙනාටම සිය ගෞරවපූර්වක ස්තූතිය පුදු කරන වැලිඅමුණ මහතා ඉදිරි අනාගතයේදීත් ආයතනයේ මෙහෙවර තවදුරටත් අඛණ්ඩව ඉදිරියට ගෙනයාම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයට සැමදෙනාගේම සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටී.

ජේෂ්ඨ හිතිඥවරයෙකු වන ජේ.සී වැලිඅමුණ මහතාට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය හා එක්වන ලෙස වචනය ආයතනයේ සිටි භාරකාරුවන් ආරාධනා කරනු ලැබුවේ 2002 වසරේ ජූලි මාසයේදීය. එතැන් සිට විවිධ දුෂ්කරතා හා අභියෝගයන්ට මුහුණ දෙමින් ශ්‍රී ලංකාව තුළ දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වන ප්‍රධානම ඉල්ලීම දැඩි දූෂණයට එරෙහිව සංවිධානය බවට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පත් කිරීමට වැලිඅමුණ මහතා නායකත්වය සැපයීය.

ජාත්‍යන්තර දූෂණ විරෝධී ගෝලීය ජාලයට ක්‍රියාකාරී දායකත්වයක් සපයන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට, සිවිල් සමාජයේන් රාජ්‍ය අංශයේ සහ පුද්ගලික අංශයේන් ගෞරවය හා විශ්වාසය දිනාගත හැකි වූයේ ප්‍රධාන වශයෙන්ම පසුගිය අව වසර තුළ වැලිඅමුණ මහතා සැපයූ දූරදර්ශී නායකත්වය හා ක්‍රියාකාරීත්වය යටතේය.

"අපගේ සිහිනය තමයි දූෂණයෙන් තොර රටක් බිහිවෙනවා දැකීම. ඒ සිහිනය සැබෑ කරගන්නට මූලිකත්වය ගැනීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට හැකියාව තිබෙනවා. මා හැමදෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ ඒ සඳහා ඔබගේ පූර්ණ සහයෝගය ලබාදෙන ලෙසයි" වැලිඅමුණ මහතා සිය සමුගැනීමේදී පැවසීය.

"අපට කාළයෙන් කාළයට දේශපාලන කරලියෙන් එල්ලවන බාධාවන්ට මුහුණදීමේ සිදුවන බව රහසක් හොවෙයි. මම විශ්වාස කරනවා වචනය බලපෑම් එල්ල කරන්නේ දේශපාලන නායකයන්ටත් වඩා දේශපාලනපත්වීම් ලැබූ දේශපාලන අතකොළුවන් බව" වැලිඅමුණ මහතා කීවේය.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ඉතිහාසය එළිදැක්වේ

වසර 1999 දී ඇරඹුනු ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ගතවූ දශකයක අධික කාළයක් තිස්සේ මෙරට දූෂණය අවම කරලීම සඳහා සිදු කළ මෙහෙවර හා එහි ඉතිහාසය පිළිබඳව ලියැවුණු පොතක් පසුගියදා එළිදැක්වන ලදී.

"ඉන් සර්චි ඔෆ් ඉන්ටග්‍රිටි" (In search of Integrity) නම් වූ එම ග්‍රන්ථයේ කතුවරයා ප්‍රවීන මාධ්‍යවේදියකු හා ගත්කතුවරයෙකු වන ඩී.සී. රණතුංග මහතාය.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ඉතිහාසය අළලා ලියැවුනු එම පොතේ පිටපත් එහි පළමු සභාපති අර්ථත විතුම්නායක, හිටපු අධ්‍යක්ෂවරයන් වන ආචාර්ය පාක්‍රසෝති සරවනමුත්තු, ජර්මානු තාක්‍රාපති යෙන්ස් ජලුවීනර්, සාමාජික එස්.පී. පුංචිහේවා යන මහත්වරුන් ඇතැළු අමුත්තන්ට පිළිගැන්වීම සිදුවීය.

තොරතුරු දැනගැනීමේ අයිතිය ගැන අපේ ශ්‍රාවකයින් උනන්දුයි

- ඌව ප්‍රදා ගුවන්විදුලි මාධ්‍යවේදීහු පවසති

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මහජන දැනුම්වත්භාවය වර්ධනය කිරීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ඌව ප්‍රදා ගුවන්විදුලිය සමඟ ක්‍රියාත්මක කළ වැඩසටහන් මාලාවට ඉතාම හොඳ මහජන ප්‍රතිචාරයක් ලැබෙමින් පවතින බව ඌව ප්‍රදා ගුවන් විදුලියේ ජනමාධ්‍යවේදීහු පවසති.

ඔවුන් මේ බව ප්‍රකාශ කළේ පසුගිය පෙබරවාරි 22 හා 23 දෙදින තුළ බණ්ඩාරවෙල "ගලවිර් කෝනර්" හිදී පැවති පසුවිපරමි හා පුහුණු වැඩමුළුවකට සහභාගී වෙමිනි.

"පනනාදු සුවත් සඟරාව හරහා අප මූලික වශයෙන් උන්නාහ කළේ තොරතුරු දැනගැනීමේ අයිතිය ඇති වැදගත්කම ගැන සාමාන්‍ය ජනතාව තුළ යම් උනන්දුවක් ඇති කිරීමටයි.

මේ වනවිට අපේ ශ්‍රාවකයින්ගෙන් සැලකිය යුතු පිරිසක් වචරෑ අයිතියක් තිබෙන බව දන්නවා. ඒ රටේම චය විදුනොදා තීරණ ගැනීමට බලපාන වරිනා අයිතිවාසිකමක් බවටත් ඔවුන් තුළ හැඟීමක් තිබෙනවා. ඔවුන් අතරින් සමහරු ඔවුන්ගේ ගෙඩි ප්‍රමාණය අනුව ඒ අයිතිය පාවිච්චි කරන්නත් උත්සාහ ගන්නවා."

"තොරතුරු දැනගැනීමේ අයිතිය ගැන වැඩසටහන් කිරීම අපටත් අලුත් අත්දැකීමක් වුණා. ඒ වැඩසටහන් වලින් පස්සේ ලංකාවේ විවිධ ප්‍රදේශවල ශ්‍රාවකයෝ කතා කරලා ඊට සමාන තමන්ගේ අත්දැකීම් ගැන අපට කිව්වා. ඒ තමයි අත්දැකීම් අපි මුලින් සාකච්ඡා කළ ඒවාවත් වඩා ප්‍රබල සිද්ධි. අපි හැමවන ඒවා ගැන අලුත් වැඩසටහන් කළා."

"මෙතේ වතු පාලනය කරන කොම්පැණි හැම අදුරුවැදුක් පාසාම ඔවුන්ගේ වාර්ෂික වාර්තා වල කම්කරුවන්ට ලබා දෙනවා. ඒ වාර්තා දෙන්නේ කම්කරුවන්ට කොටස් හිමිකම් තිබෙන නිසා. ඒත් ඒ වාර්තා තිබෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් විතරයි. ඒවායේ මොනවා තියෙනවද කියල ඒ කම්කරුවෝ කිසිම කෙනෙක් දන්නේ නැහැ. සමහර කම්කරුවෝ අඩුරුදු 10 ක 15 ක වාර්තා හොසියලාම ගොඩගසාගෙන ඉන්නවා. ඔවුන් දීර්ඝ කාලයක ඉඳල ඒ වාර්තා තමන්ගේ භාෂාවෙන් පරිවර්තනය කරල දෙන්න කියල ඉල්ලීම් කරල තියෙනවා. ඒත් රහසක් ප්‍රතිචාරයක් ලැබිලා නෑ. වෘත්තීය සමිතිත් ඒ පිළිබඳ නිහඬයි.

මට මේ තොරතුරු දැනගන්න ලැබුනේ වෙනත් වැඩසටහනකට එකතුවෙලා ගිය දවසේ. මම තොරතුරු දැනගැනීමේ අයිතිය පැත්තෙන් ඒ ප්‍රශ්නය මතුකරල අපේ ගුවන් විදුලියට කරපු දෙමළු වැඩසටහනට කම්කරු පන්තාවගෙන් ඉතා හොඳ ප්‍රතිචාරයක් ලැබුණා. දැන් ඒ මිනිස්සුන්ගේ විවිධ ප්‍රශ්න ගැන අපට තොරතුරු කියනවා."

"පනනාදු පුවත් සඟරාව හරහා තොරතුරු දැනගැනීම ගැන අප කළ වැඩසටහන් වලින් අපේ ගුවන් විදුලිය ගැන තිබුණ විශ්වාසය තව තවත් ඉහළ ගොස් තිබෙනවා. ප්‍රදේශයේ ප්‍රශ්න ගැන නොසියළු කතාකරන සහ දූෂණයට එරෙහිව හඬනඟන සුදුහැලියන් පිරිසක් දැන් අප වටා ඒකරාශී වී සිටිනවා. ඔවුන් තමන්ගේ ප්‍රදේශ සංවර්ධනයට වෙන් කරන මුදල් ගැන, ඒවා වියදම් කරන ආකාරය ගැන උනන්දුයි. ඒක අපටත් සතුටක්."

කණ්ඩායමක් වශයෙන් ඔවුන් සියලු දෙනාටම තමන්ගේ අත්දැකීම් ගැන ප්‍රකාශ කරන්නට බොහෝ දේ තිබිණි.

පසුවිපරමි වැඩමුළුවලදී එම ජනනාදු සුවත් සඟරා වැඩසටහන් ශ්‍රාවකය කරමින් එවා වැඩිදියුණු කළහැකි ආකාරය ගැනත්, වැඩසටහන් හරහා තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වඩාත් පුළුල් අවබෝධයක් ලබාදීමට යොදාගතහැකි ක්‍රමෝපායන් පිළිබඳවත් සාකච්ඡා කරනු ලැබිය.

මෙම පුහුණු වැඩමුළුව සඳහා ඌව ප්‍රදා ගුවන්විදුලියේ කළමණාකාර රංජිත් අමරසිංහ මහතාද සහභාගී වූ අතර ශාන් මිශේතුංග, දිල්රංජෙෂ් හඳුන්නෙත්ති, හා ආනන්ද අත්සරකර යන මාධ්‍ය පුහුණුකරුවන් සමඟ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් බංගලාදේශ ශාඛාවේ සෙමෝසා හල්දර මහත්මිය සහ හර්ෂ දසනායක (TISL) මහතාද සම්පත් පුද්ගයන් වශයෙන් සහභාගී වූහ. ඌව ප්‍රදා ගුවන්විදුලියේ මාධ්‍යවේදී එස් අශෝකන් මහතා පරිවර්තන කාර්යයට දායක වීය.

F.M 98.4 ඔස්සේ සිංහල හා උර්දු භාෂාවන්ගෙන් ඌව ප්‍රදා ගුවන්විදුලි වැඩසටහන් විසුරුවා හැරෙන අතර උඩව පළාතට අතිරේකව සබරගමුව, දකුණ, මධ්‍යම, උතුරු මැද, නැගෙනහිර හා වයඹ පළාත්වල ශ්‍රාවකයින්ටද එම වැඩසටහන් ශ්‍රවණය කළ හැකිය.

පුරවැසි අත්වැල

දැඩි මහජන ප්‍රසාදයට

දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉටුවන සේවාවන් පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් "පුරවැසි අත්වැල" මහජන අත්පොතට පුළුල් මහජන ප්‍රතිචාරයක් ලැබෙමින් පවතී.

සිංහල හා දෙමළ භාෂාවලින් ප්‍රකාශයට පත් කර ඇති මෙම අත්පොත මඟින් මහජනතාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් සේවාවන් ඉදි කරගැනීමේදී ඒ සඳහා ගත යුතු පියවර, අවශ්‍ය වන ලිය කියවිලි හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉටු කරනු ලබන සේවාවන් පිළිබඳවද තොරතුරු ඉතා සරලව ඉදිරිපත් කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් සිදුවන ඉඩම් උපයාගැනීම හැඳුනුම්පත්, විදේශ ගමන් බලපත්‍ර උප්පැන්න සහතිකය ඇතැළු බලපත්‍ර ගිණුත් කිරීම සමාජ සුභසාධක කටයුතුවල සමෘද්ධි ඇතැළු සියලුම සේවාවන්ට අදාළ තොරතුරු පුරවැසි අත්වැලෙහි විස්තර කර තිබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ කිහිපයක ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් සිදු කරන ලද පුහුණුවට එරෙහි වැඩසටහන්වලදී මාවතගම පිටපු ප්‍රාදේශීය ලේකම්වරයා ඇතැළු ඊට සහභාගී වූ රාජ්‍ය නිලධාරීන් හා මහජනතාව විසින් කළ ඉල්ලීම්කට අනුව මෙම අත්පොත සම්පාදනය කෙරිණි.

සේවා සැලසාගැනීම පිළිබඳව මහජනතාව දැනුම්වීරවී සිටින ප්‍රමාණයට සාපේක්ෂව අතරමැදියන්ට ජනතාව ගතා කෑමට ඇති අවස්ථාව අහෝසි වී යන බව එම වැඩමුළුවලදී ඊට සහභාගී වූ පුරවැසි කමිටු සාමාජිකයින් සහ රාජ්‍ය නිලධාරිහු පෙන්වා දුන්හ.

මේ වන විට එම පොතෙන් පවතින ප්‍රයෝජනය පිළිබඳව සෑම ප්‍රදේශයකින්ම මහජන ප්‍රසාදය පළවෙමින් තිබෙන අතර එහි පිටපත් ලබාගැනීම සඳහා ප්‍රදේශයේ විවිධ ප්‍රදේශවලින් ඉල්ලීම් ඉදිරිපත් වෙමින් තිබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ පසුබිම පුරවැසි අත්වැල පොත් 6000 ක් මාවතගම සහ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බල ප්‍රදේශයන්හි ජීවත් වන පවුල් අතර නොමිලයේ බෙදා දෙන ලදී. අතතුරුව යුරෝපා සංගමයේ ආධාර ඇතිව ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර, පොළොන්නරුව සහ අම්පාර යන දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයක අදියර කිහිපයක් යටතේ මෙම අත්පොත නොමිලේ බෙදා හැරීමට සැලසුම් කර තිබේ.

පුරවැසි අත්වැල ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් එහි අත්තරගතය පිළිබඳව ප්‍රජා නායකයන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට පුහුණු වැඩමුළු කිහිපයක්ම පවත්වන ලදී.

මේ වන විට එම පොතෙන් පවතින ප්‍රයෝජනය පිළිබඳව සෑම ප්‍රදේශයකින්ම මහජන ප්‍රසාදය පළවෙමින් තිබෙන අතර එහි පිටපත් ලබාගැනීම සඳහා ප්‍රදේශයේ විවිධ ප්‍රදේශවලින් ඉල්ලීම් ඉදිරිපත් වෙමින් තිබේ.

පුරවැසි අත්වැල සම්බන්ධව තොරතුරු ලබාගැනීමට අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න www.tisrilanka.org

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
සුපිළිපන් දේශයක් උදෙසා

සුපිළිපන්

මාර්තු 2011

රාජ්‍ය දේපළ අයථා පරිහරණයට වැට බැඳීම

පළාත් පාලන මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය දේපළ බවර හෝ දේශපාලන පක්ෂයකට හොම්බෙල් භාවිතා කිරීමට ඉඩ දීම රාජ්‍ය දේපළ අයථා පරිහරණය කිරීමක් ලෙස සලකනු ලබන බව මැතිවරණ කොමසාරිස්වරයා විශේෂ චක්‍රලේඛයක් මඟින් සියලුම රාජ්‍ය හා පළාත් පාලන ආයතන ඉදිරිහින් වෙත දැනුම් දී තිබේ.

දේශපාලන පක්ෂයකට මැතිවරණ ප්‍රචාරණ කටයුත්තක් සඳහා රාජ්‍ය දේපළක් අවශ්‍යනම් ඒ සඳහා සාධාරණ මුදලක් අය කළ යුතු බවත්, එම රාජ්‍ය දේපළ ඉබාඳිය යුත්තේ දේශපාලන පක්ෂ විසින් ඒවා ඉල්ලුම්කරන අනුපිළිවෙලට අනුව බවත්, ඊට අදාළව අනිවාර්යයෙන්ම ලේඛනයක් පවත්වාගෙන යා යුතු බවත් මැතිවරණ කොමසාරිස් වරයා එම චක්‍රලේඛය මඟින් වැඩිදුරටත් අවධාරණය කර දී තිබේ.

ඔහු මෙම උපදෙස් මාලාව තිතුත්කර ඇත්නේ පසුගියදා දේශපාලන පක්ෂ නායකයින්ගේ සහභාගීත්වයෙන් පවතා රැස්වීමකදී තීන්දු තිබුණද ඒ කිසිවක් නොසළකා පොදු දේපල අයථා ලෙස පරිහරණය වීම සිදුවන බව පක්ෂ නායකයින් විසින් පෙන්වා දීමෙන් අනතුරුවය.

මහජනතාවගෙන් උපයාගන්නා බදු මුදල් මඟින් නවීන්තු කරන රජයේ යාන වාහන, හෙළිකොප්ටර් හා ගුවන් යානා ඇතැළු ප්‍රවාහන පහසුකම්, රාජ්‍ය හා සංස්ථා සේවකයින්, රජයේ හෝ පළාත් පාලන ආයතන සතු රැස්වීම් ශාලා, උත්සව ශාලා, ඇතැළු හොඳනැරඹිලි හා පිරිවින් ආදිය, රාජ්‍ය මාධ්‍යවල ගුවන් කාලය ආදී සියලුම රාජ්‍ය දේපළ ලෙස සැලකෙන අතර ආණ්ඩුවකුම ව්‍යවස්ථාවේ පැරිච්ඡේද සංඛ්‍යාවන් 104 (1) (ඇ) වගන්තිය මඟින් දෙපළසේපළ අයථා පරිහරණය වැළැක්වීමේ බලය මැතිවරණ කොමිසමට (දැනට මැතිවරණ කොමසාරිස් වරයාට) පවරා තිබේ.

මැතිවරණ කොමසාරිස්වරයා ඉහත චක්‍රලේඛය කිතුත්කර ඇත්තේ මැතිවරණ කොමිසමට පැවරී ඇති බලතල අනුවය.

බලය දරන දේශපාලන පක්ෂය විසින් සිය ප්‍රචාරන කටයුතු සඳහා රාජ්‍ය දේපළ පිසීයේ පාවිච්චි කිරීම දීර්ඝ කාලයක සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින නරක සම්ප්‍රදායයකි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ආරම්භයේ සිටම පොදු දේපළ අයථා පරිහරණය තම මැතිවරණ නිරතෂණ වාරතා මඟින් පෙන්වා දී තිබේ.

පමාවී හෝ ඒ පිළිබඳව මැතිවරණ කොමසාරිස් වරයාගේ අවධානය යොමුවීම යහපත් ප්‍රවණතාවයකි. එහෙත් එයින් සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැක්කේ "පොදු දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීමේ සහ අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීමේලිලට එරෙහිව ක්‍රියාකිරීමේ වගකීම හිමි මහජනතාව ඒ පිළිබඳව දැඩි විමසිලිමත්භාවයකින් ක්‍රියාකරන්නේනම් පමණි.

සුපිළිපන් දේශයක් උදෙසා
දූෂණය මැඩලීමට පෙළගැසෙමු

චීන්න අප හා එක්වන්න

28/1, බුල්ට්ස් පදුමය, කොළඹ 07
Tel: 0112501474 Fax: 0112592287
tisl@tisrilanka.org www.tisrilanka.org
facebook.com/tisrilanka twitter.com/tisrilanka

ප්‍රාදේශීය සභා පරිපාලනයට මහජන සහභාගීත්වය ලබාගත යුතුයි

ප්‍රාදේශීය සභාවල පරිපාලනය සහ ප්‍රදේශයට අදාලව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලදී තීරණ ගැනීම සඳහා මහජන සහභාගීත්වය ලබා ගත යුතු බව ප්‍රාදේශීය සභා පනත මඟින් නිර්දේශ කර ඇතත් එය නිසි ලෙස ක්‍රියාත්මක නොවන බව නීති හා ව්‍යවස්ථා විශාරදයෝ පෙන්වා දෙති.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින් ප්‍රාදේශීය සභාවල පරිපාලනමය කටයුතුවලදී තීරණ ගැනීම සඳහා මහජන සහභාගීත්වය ලබාගැනීමට නිර්දේශ කර ඇත. එහෙත් පනත සම්බන්ධයෙන් මහජනතාව තුළ පවතින අනවබෝධයත් පනත මඟින් තියම කර ඇති නිර්දේශ වලට අනුකූලව ප්‍රාදේශීය සභාවලට පත්වන සභිකයන් ක්‍රියා නොකිරීමත් හේතුවෙන් ප්‍රාදේශීය පරිපාලනයේ මහජන සහභාගීත්වය ඉතා දුර්වල මට්ටමක පවතින බව නිතිඥ එස්.පී. පුංචිහේවා මහතා පෙන්වා දෙයි.

මේ හේතුවෙන් පළාත් පාලන ආයතන මට්ටමින් සිදුවන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව මහජනතාව දැඩි අසතුට පළ කරන අතර ප්‍රාදේශීය සභා මහජන අවශ්‍යතා අනුව එම ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබා නොදෙන බවත් වඩාත් ප්‍රයෝජනවත් ලෙස සේවා පවත්වාගෙන නොයන බවටත් මැසිවිලි නැඟේ.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මඟ පෙන්වීම යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශ දෙකක් තියැදිය ලෙස තෝරා ගනිමින් සිදු කළ පුරවැසි ඇගයීම් වාර්තාපත් සමීක්ෂණයකදී ද මේ බව තහවුරු වී තිබේ. එහිදී එම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ දෙකේ ජීවත් වන මහජනතාව අතුරින් සියයට 64 ක් ප්‍රාදේශීය සභාව මඟින් ඉටුවන සේවා පිළිබඳව තමන් අතෘප්තිමත් බව ප්‍රකාශ කර ඇත.



ප්‍රාදේශීය සභා පනතට අනුව ප්‍රාදේශීය සභාවක පරිපාලනමය කටයුතු වලදී උපදෙස් හා තීරණ ගැනීම සඳහා කමිටු 04 ක් පත් කර ගත යුතුය. ඉදිරි හා ප්‍රතිපත්ති සැකසීමල නිවාස හා ප්‍රජා සංවර්ධනය, තාක්ෂණික සේවා සහ පරිසරය හා පහසුකම් වලලය පත්කළ යුතු කමිටුය. එහෙත් ප්‍රාදේශීය සභාවලින් බහුතරයක එම කමිටු පවත්වාගෙන නොයන බව ව්‍යවස්ථා විශාරද ආචාර්ය ජයතිස්ස කොස්තා මහතා ද පෙන්වා දෙයි.

බදුල්ල දිස්ත්‍රික්කයේ සම්මේළනයට ලක් වූ ප්‍රාදේශීය සභා ඉහත කමිටු පත්කිරීමට ඒකමතිකව තීන්දු ගෙන තිබුනද එම කමිටු පත් කර නොතිබුණු බව හෙළිදරව් විය.

මෙලෙස මහජන සහභාගීත්වය ලබා නොගැනීමත්, මහජනතාවට වඩාත් ප්‍රයෝජනවත් සංවර්ධන ව්‍යාපෘති වලට ප්‍රමුඛතාව ලබා නෙදීම සහ සේවා පවත්වා ගෙන යාමට මහජන උපදේශයන් ලබා නොගැනීම යන කාරණා හේතුවෙන් පළාත් පාලන ආයතන බහුතරයක් පිළිබඳව මහජනතාවගේ විශ්වාසය පළුදු වී ඇත.

එබැවින් ඉදිරි ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් පසුව හෝ මහජන සහභාගිත්වය ලබා ගැනීමට බලයට පත්වන සභාකයන් පියවර ගත යුතුය.



ප්‍රාදේශීය සභාවන් සමග ප්‍රතිචාර දැක්වුවන්ගේ පැවති සබඳතාවය පිළිබඳ තක්සේරුව
ඉතා සමීපයි
තරමක් දුරට සමීපයි
කිසිදු සබඳතාවයක් නැත
නොදනී / කිව නොහැක
ප්‍රතිචාරයක් නැත

3.

ජාතික සුපිළිපන් ප්‍රණාම 2010

දූෂණට එරෙහිව පුරෝගාමී මෙහෙවරක නිරත වූ පුද්ගලයින් සහ සංවිධාන වෙත ප්‍රණාම පිදෙන ජාතික සුපිළිපන් ප්‍රණාම උළෙල දෙසැම්බර් 09 වැනි දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ "මිගිලක මැදලේදී" පැවැත්විණි.

මෙවර උළෙලේ ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගීවූයේ ප්‍රකට ලේඛකයෙකු හා සමාජ ක්‍රියාකාරිකයෙකු වන නේපාල ජාතික කනක් මනි ඩික්සිත් මහතාය. උළෙලේ විශේෂ ආරාධිත අමුත්තා වශයෙන් කුරුණෑගල හිටපු දිස්ත්‍රික් ලේකම් ජයන්තා බුළුමුල්ල මහත්මිය සහභාගී වූවාය.

විදුලි සංදේශ නියාමන හා තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීණයකු වන ආචාර්ය රොහාන් සමරජීව, ගත්කතුවරයෙකු හා කාන්තා අධ්‍යාපන හා විමර්ශන මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සෙළිවි තිරුචන්ද්‍රන් සහ විද්‍යා ලේඛකයෙකු හා ජනමාධ්‍යවේදියෙකු වන නාලක ගුණවර්ධන යන මහත්ම මහත්මීහු 2010 සුපිළිපන් ප්‍රණාම විනිසුරු මඩුල්ල ලෙස කටයුතු කළහ.

පෝද්දලගේ සම්මානය දෙමව්පියන්ට

2010 වසරේ අන්තර්ජාතික සුපිළිපන් ප්‍රණාමයෙන් පිදුම්ලද යමේක්ෂණාත්මක මාධ්‍යවේදී පෝද්දල ජයන්ත මහතාට හිමි සම්මානය ඔහුගේ මෑණියන් සහ පියාණන් වෙත පිළිගැන්වීමේදී ජාතික සුපිළිපන් ප්‍රණාම උළෙලේදී උත්කර්ෂවත් අයුරින් සිදු කෙරිණි.

පෝද්දල ජයන්ත මහතා දුෂණය මැඩලීම වෙනුවෙන් සිදුකරන ලද වීගිණ්ම මෙහෙවර අගය කරමින් එම සම්මානය පිරිනැමුණේ පසුගියදා තායිලන්තයේ බැංකොක් නුවර පැවති අන්තර්ජාතික දූෂණ විරෝධී සමුළු සැසිවාරයේදීය. එදින ඔහු වෙනුවෙන් එම සම්මානය පිළිගනු ලැබුවේ TISL හි (එවකට) විධායක අධ්‍යක්ෂවරයා වූ ජේ. සී. වැලිඅමුණ මහතාය.

පෝද්දල ජයන්ත මහතා ශ්‍රී ලංකාවේ මෙතෙක් වාර්තාවූ විශාලම වංචාව ලෙස සැලකෙන රුපියල් කෝටි 357 වැටී බදු වංචාව මුල්වරට හෙළිදරව් කළ ජනමාධ්‍යවේදියාය. ඔහු ජීවිත තර්පන නොතකා මාධ්‍යකරණයේ යෙදෙමින් මහා පරිමාණ වංචා - දූෂණ රැසක් ගවේෂණාත්මකව හෙළිදරව් කළේය.

සුවිශේෂී බලයක් දැරූ මැර කණ්ඩායමක් විසින් ඔහුව පසාරොගෙන ගොස් 'ලිම්ප සහ අදහස් පළකිරීම මුළුමනින්ම නතරකරන ලෙස තර්පනය කරමින්' දරුණු වධ හිංසනයට ලක්කර ඔහුගේ පාදයක් මිඳ දැමූ අතර්ථාව දක්වාම පෝද්දල ජයන්ත මහතා දූෂණ විරෝධීයෙකු හා මාවම හිමිකම් ක්‍රියාකාරිකයෙකු ලෙස විශාල සමාජ මෙහෙවරක යෙදී සිටියේය.

මෙම මහජන රැස්වීම් කිහිපයේදීම මහජනතාව හා රාජ්‍ය නිලධාරීන් යන දෙපිරිසම පෝද්දල ජයන්ත මහතාගේ දැඩි උනන්දුවකින් යුතුව අදහස් දැක්වීමද රාජ්‍ය නිලධාරීන් දේපිරිවරීම මහජනතාව හොඬියන් අදහස් පළකිරීමද විශේෂයෙන් කැපී පෙනුණි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය 2009 වර්ෂයේ සිට මාවතගම හා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ තුළ දූෂණය පිදුදැකීම හා යහපාලනය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව වීවිධ වැඩමුළු හා පුහුණු වැඩසටහන් ..... කර ඇතිබව ප්‍රමාණයක් පැවැත්වූ අතර එම වැඩමුළු මඟින් පුහුණුවූ ලැබූ ග්‍රාම නිලධාරීවරු, සමෘද්ධි නිලධාරීවරු, සිවිල් සමාජ ක්‍රියාකාරීන් ගේ සංඛ්‍යාව ..... ඉක්මවයි.

පෝද්දල ජයන්ත මහතාගේ ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි වාර්තා වැඩසටහනක්ද සුපිළිපන් ප්‍රණාම උළෙලේදී ප්‍රදර්ශනය කෙරිණි.

පෝද්දලගේ දෙමාපියන් සම්මානය අතැතිව

" උත්සවය හරිම ලස්සනයි. දරුවා ගැන හදල තිබුණ එපැපරියන් ලස්සනයි. ඒත් දරුවාගෙ කකුල කඩල ඉස්පිරිතාලෙට ගේන එක පෙන්නපු වෙලාවේ නම් මම තද කරල ඇස් දෙක පියා ගත්තා.
"

ඒ සිද්ධියෙන් පස්සේ බල්ලෙක් උඩුබුරනවා ඇතුණත් අපි ගැස්සිලා ඇහැරෙනවා. දරුවා ලොකාව දාල ගියපු එක හොඳයි. අපිට දකින්න හැකි වුණත් කොහේහර් හොඳින් ඉන්නව කේදු කියල අපිට හිත හදාගත්තෑකි"

ශ්‍රී ලංකාවට වටිනා පුරවැසියෙකු දායාද කළ පෝද්දලගේ මෑණියන් වන එන්.ජී.කරලයින් මහත්මිය පැවසුවේ දෙමෙහෙතින් නැඟෙන කළුළු පිටි අැල්ලෙන් පිසදමමිනි.

සම්මාන උළෙලට සහභාගීවූ පිරිසෙන් කොටසක්

ගංවතුරෙන් විපතට පත් වූවන්ට මිත්‍රත්වයේ දෑත් දිගු කෙරේ

අනුරාධපුර, පොළොන්නරුවේ හා අම්පාර දිස්ත්‍රික්කයන්හි පසුගියදා ඇති වූ ගංවතුරෙන් පීඩාවට පත් වූ ජනතාවට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා